මධ්‍යම පරිසර අධිකාරිය - 2022
-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පරිසර අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ තොග මිලදී ගැනීම් අදාළ තොග ගිණුම්වලට හර නොකර වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණු අතර තොග නිකුත් කිරීම් ගිණුම් ගලපා නොතිබුණි. වර්ෂය අවසානයේ භෞතික සත්‍යාපන තොගය අනුව තොග ගිණුම්වල ඉතිරි තොග ශේෂය ගලපා වෙනස වියදම් ගිණුම්වලට හර හෝ බැර වශයෙන් ගැලපීම් කර තිබුණි. වියදම් ගිණුම්වලට බැර වූ වටිනාකම්වල එකතුව ඊළඟ වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණු අතර ඒ ආකාරයට පෙර වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු වියදම් හර කර සමුච්චිත අරමුදලට බැර කළ වටිනාකම රු.9,959,382 ක් විය. තොග මිලදී ගැනීම් හා නිකුත් කිරීම් නිවැරදිව ගිණුම් ගැලපීමට කටයුතු නොකර මේ ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම, ගෙවිය යුතු වියදම හා සමුච්චිත අරමුදල් ශේෂය නිවැරදිව නිරූපණය වන බවට සනාථ කළ නොහැකි විය. | තොග ගිණුම්ගත කිරීම සම්බන්ධව පැහැදිලි අදහස් දැක්වීමක් සිදුකර නැත. | තොග මිලදී ගැනීම් හා නිකුත් කිරීම් නිවැරදි ආකාරයට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 24 ඡේදය ප්‍රකාර අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා සසඳා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | වර්ෂ අවසානයේ අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා සැසඳීම සිදු කරන අතර යම් විචලතායක් වේ නම් එය කළමනාකරණ මණ්ඩලයට සහ විගණනය වෙත ඉදිරිපත් කිරීම සිදුවේ. | අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා සසඳා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | දේපල පිරියත හා උපකරණ තුළ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතයට ගන්නා පිරිවැය රු.374,750,208 ක් වූ අයිතම 08 ක් පැවතිය ද, එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂා කර බලා එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව නැවත සමාලෝචනය කර 2023 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට නියමිතය. | ප්‍රමිතිය ප්‍රකාරව ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දේපල පිරියත හා උපකරණ පිරිවැය වටිනාකම තුළ ඇතුළත් ගෘහස්ථ වායු තත්ත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියට අදාළ පිරිවැය රු.11,605,308 ක් වූ මිනුම් උපකරණ 2016 වසරේ සිට අක්‍රියව පැවතුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 (අ) හා (ආ) ඡේද ප්‍රකාරව ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දැක්වීම නිවැරදි නොවේ. | ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ගස්ථ තොග හා කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධන ගිණුමේ පෙර වර්ෂය අවසානයට එකතුව රු.9,596,172 ක් වූ තොග අයිතම 07 ක ශේෂය, සමාලෝචිත වර්ෂයේ ලෙජරයේ ආරම්භක ශේෂය වශයෙන් ගැනීමේදී රු.10,657,132 ක් වශයෙන් රු.1,060,960 ක් වැඩියෙන් දක්වා තිබුණි. ආරම්භක ශේෂය, ඊට අදාළව | පරිපාලන අංශයෙන් ලබාදුන් තොරතුරු මත සංශෝධනය කරන ලද බව සඳහන් කර ඇති අතර පැහැදිළි අදහස් දැක්වීමක් සිදුකර නැත. | පෙර වර්ෂය අවසානයට ඇති ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය වශයෙන් නිවැරදිව දැක්විය යුතු අතර උපලේඛනයන් හා සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ උපලේඛනය සමඟ සැසඳීමේදී ද රු.261,828 ක වෙනසක් නිරීක්ෂණය විය. | | අදාළ සංශෝධන අනුමත ජර්නල් වවුචර් මඟින් සිදුකළ යුතුය. |
| (ආ) | කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුමේ අධි වෙන්කිරීමක් ලෙස දක්වා තිබූ රු.1,708,574 ක වටිනාකම, ගිණුම් තුලනය කිරීම සඳහා භාවිතා කළ අවිනිශ්චිත ගිණුම් ශේෂයන් බවට නිරීක්ෂණය වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.18,251,035 ක කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ශේෂයේ නිවැරදිතාවය සනාථ කළ නොහැකි විය. | කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුම නිවැරදි බවට නිවැරදි නොවන අදහස් දැක්වීමක් සිදුකර ඇත. | අවසන් නොකළ කාර්යයන්ට අදාළව වැයකළ මුදල් නිවැරදිව කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.906,692 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සහ ඉදිකිරීම් කටයුතු අවසන් කළ රන්දෙණිය සොබා කෙත මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වියදම් රු.4,168,141 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර මාර්ගස්ථ තොග හා කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව එම වත්කම්වලට අදාළව ක්ෂය කිරීම් ද ගණනය කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය වියදම හා සමුච්චිත ක්ෂය අඩුවෙන් දැක්වුණි. | ලිපිගොනු නිසි පරිදි පරීක්ෂාකර සම්පූර්ණ කර ගැනීමෙන් අනතුරුව 2023 වර්ෂයේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කෙරේ. | කටයුතු අවසන් කළ හා භාවිතයට ගත් වත්කම් ප්‍රාග්ධනිත කර ක්ෂය ගණනයන් සිදුකර නිවැරදිව ගිණුම් ගැලපීම් සිදුකළ යුතුය. |
| (ඈ) | පරිසර අධිකාරියේ Firewall මෘදුකාංගය සපයා ස්ථාපනය කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත 2018 වර්ෂයේ ලබා දී තිබූ රු.3,475,005 ක ඇණවුමකට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.3,127,505 ක් ගෙවා තිබුණ ද, ඊට අදාළව කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුමේ ඇතුළත් වටිනාකම රු.1,563,877 ක් පමණක් වූයෙන් එම ගිණුමේ ශේෂය රු.1,563,628 ක් අඩුවෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ දී මෙම මුළු මුදලම ගෙවා අවසන්ව ඇති අතර මෙම මුළු වටිනාකම 2023 කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුමෙන් ඉවත් වේ. | වැඩ අවසන් නොකළ කාර්යයන්ට අදාළව ගෙවන ලද සියලුම මුදල් කෙරීගෙනයන වැඩ ගිණුමට ඇතුළත් විය යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට අදාළව සිදුකර 2022 දෙසැම්බර් මස ලබා දී තිබුණු පුස්ථකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව ලියා හැරී පොත් 1,024 ක් හා නැති වූ පොත් 2,746 ක් සම්බන්ධයෙන් ගිණුම් ගැලපීම් සිදු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා වූ පුස්තකාල පොත් තොග සමීක්ෂණය 2022 දෙසැම්බර් 23 සිදු කර ඇත.<br>1984 වසරේ සිට මෙම පුස්තකාලයේ පොත් එකතුව නඩත්තු වන බැවින් 2022 වසරේදී සිදු කළ තොග සමීක්ෂණ | තොග සමීක්ෂණය අනුව ලියාහැරි පොත් හා නැති වූ පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා ගිණුම් |

| | | | |
|---|---|---|---|
| | | වාර්තාවට අනුව නැති වූ පොත් පිළිබඳව නිවැරදි වාර්තාවක් ලබා ගැනීම සඳහා නැවත සමීක්ෂණයක් සිදුකර 1984 වසරේ සිට නැති වූ පොත්වල වටිනාකම වසර අනුව ගණනය කර ගිණුමෙහි නිවැරදිව ගැලපීම් සිදුකිරීමට නියමිතය. | ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග වෙන වෙනම ගිණුම්ගත කිරීමට කටයුතු නොකර එක් ලෙජර් ගිණුමක් යටතේ දක්වා තිබීමෙන් ඒවා පැහැදිලිව වෙන්කර හඳුනාගැනීමට නොහැකි විය. | ඉදිරියේ දී කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂයන් වෙන් වෙන්ව විස්තරාත්මකව අවසන් ගිණුම්වල පෙන්වීමට කටයුතු කරන්නෙමි. | කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග මූල්‍ය ප්‍රකාශනවලින් වෙන වෙනම හෙළිදරව් විය යුතුය. |
| (උ) | පාරිසරික බලපෑම් ඇගයීම් ඒකකය මඟින් සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන තහවුරු කළ පාරිසරික ඇගයීම් බලපත්‍ර ආදායම රු.22,028,440 ක් වුවද, ලෙජර් ගිණුමට මාරුකළ ආදායම රු.568,877 ක් පමණක් වූයෙන් ආදායම් වශයෙන් ගිණුම්ගත විය යුතු රු.21,459,563 ක් ගෙවිය යුතු වියදම් වශයෙන් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | ව්‍යාපෘති යෝජකයින් විසින් ව්‍යාපෘති වාර්තාව ලබා ගැනීම සඳහා සිදු කරන තැන්පතු මුදල පාරිසරික ඇගයීම් වාර්තා සම්පූර්ණ කළ පසු අධිකාරියේ පරිපාලන වියදම් ප්‍රතිපූර්ණයෙන් පසු ඉතිරි වන ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක වන්නේ ද සලකා බලා 2023 වර්ෂයේ දී පාරිසරික ඇගයීම් ව්‍යාපෘති වියදම් ප්‍රතිපූර්ණ ආදායම ලෙස ගිණුම් වල ගැලපීමට කටයුතු සිදු වෙමින් පවතී. | වාර්ෂිකව අවශ්‍ය වන පාරිසරික ඇගයීම් ව්‍යාපෘති වියදම් අයවැය ලේඛනයෙන් වෙන් කර ගැනීමටත්, වර්ෂය තුළ අවසන් කළ කාර්යයන් හා වැය කළ මුදල් සලකා බලා වර්ෂයට අදාළව නිවැරදි ආදායම හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ඌව පළාත් කාර්යාලයේ ගෙවිය යුතු පාරිසරික බලපෑම් ඇගයීම් බලපත්‍ර වටිනාකම | 14,377,105 | 8,256,157 | 6,120,948 | අවසන් ගිණුම් හි නිසි පරිදි ශේෂය පෙන්වා ඇත. | පළාත් කාර්යාල ගිණුම් සමඟ සසඳා ගෙවිය යුතු ශේෂ වටිනාකම නිවැරදිව හඳුනාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුමට 2018 වර්ෂය දක්වා අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් බියගම ප්‍රාදේශීය සභාවෙන් රු.1,427,728 ක් හා කොළඹ නගර සභාවෙන් රු.1,313,202 ක් වශයෙන් අයවිය යුතු එකතුව රු. 2,740,930 ක් වර්ෂ 04කට අධික කාලයක් තිස්සේ අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අදාළ මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කරන මෙන් හා ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත) හා පළාත් පාලන කොමසාරිස් (බස්නාහිර පළාත) ට පිටපත් සහිතව 2021 වර්ෂයේදී බියගම ප්‍රාදේශීය සභාවේ සභාපතිට හා කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දැනුම් දී ඇත. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 30 ක බදු ගිවිසුම් යටතේ අධිකාරියට ලබා දී ඇති ඉඩම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණු අතර කන්තලේ බදු ඉඩම සඳහා 2010 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව ගෙවිය යුතු රු.792,044 ක බදු මුදල සඳහා ගිණුම්වලින් වෙන් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | බදු මුදල් ඉදිරියේ දී ගෙවීමට නියමිතව ඇත.<br>බදු මුදල් මූල්‍ය ප්‍රකාශනවලත් හෙළිදරව් නොකිරීම සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | බදු ගිවිසුම් යටතේ ලබා දී ඇති ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත්, ගෙවිය යුතු බදු මුදල් සඳහා වෙන් කිරීම් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත | | | |
| (i) 24(ඇ) - 2(1) වගන්තිය | පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය වගකිව යුතු බව දක්වා තිබුණ ද, මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, වලව්වත්ත වතුරාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සහ බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සඳහා පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීමෙන් මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික සිද්ධීන් ආශ්‍රයෙන් පැන නගින ගැටළු නිරාකරණ කරගෙන එම පාරිසරික කළාප ආරක්ෂා කර ගැනීම නිසි පරිදි සිදුවන බවට සනාථ කළ නොහැකි විය. | පරිසර ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීමේ තාක්ෂණික ක්‍රියාවලියේදී එම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ 5 සඳහා කළමනාකරණ කමිටු පිහිටුවීම නීතිමය අවශ්‍යතාවයක් ලෙස නොසැලකේ. | කළමනාකරණ කමිටු පිහිටුවා පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් එම ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 23 (අ) සහ (ආ) වගන්ති | අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ සහ එම පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට හා වෙනත් උපමානවලට අනුකූලව හැර පරිසර දූෂණය සිදුවිය හැකි අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම සිදු නොකළ යුතු වුවද, මධ්‍යම පරිසර අධිකාරියේ අප ජල පිරිපහදු පද්ධතිය සඳහා භාවිතය ආරම්භ කළ දින සිට විගණිත දිනය වූ 2023 මාර්තු 23 දක්වා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා නොගෙන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. | ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කරන ලද 2022 ජනවාරි 27 දිනැති අංක 18/2264 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා වන මධ්‍යම පරිසර අධිකාරියම තම ආයතනයට බලපත්‍රයක් නිකුත් කර ගැනීම සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. | පරිසරය සම්බන්ධ නියාමන ආයතනයක් වන බැවින් අන් ආයතනවලට පූර්වාදර්ශයක් ලැබෙන පරිදි කටයුතු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය වන නීතී සම්පාදනය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 4.1 ඡේදය | 2017 නොවැම්බර් 06 දින පරිසර නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන පාරිසරික බලපෑම් හා ඇගයීම් ඒකකයට අනුයුක්ත කොට සිටි නිලධාරිණියක් මාසයක් කල් දී හෝ ඒ වෙනුවට මාසයක වැටුප ගෙවීමක් හෝ සිදු නොකර 2018 වර්ෂයේ ඔක්තෝබර් 01 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර නිලධාරියෙකු ලෙස පත්වීම් ලබා අධිකාරියේ සේවය අතහැර ගොස් තිබුණි. එසේ වුවද, එම නිලධාරිණියට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි. | මෙම නිලධාරිණියගෙන් අධිකාරියට අයවිය යුතු මුදල් වාරික වශයෙන් පියවීම සඳහා අවසර ලබාදී තිබූ බැවින් සහ ඇය විසින් එම මුදල් ඇයගේ වර්තමාන සේවායයා හරහා අඛණ්ඩව මේ දක්වා ලැබීමට සලස්වා ඇති බැවින්, ඇය සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කිරීම සිදුකර නොමැත. | සේවය අතහැර යන නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 372 (2) | 2022 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනීම් අත්තිකාරම් රු.3,469,331 ක් හා විවිධ අත්තිකාරම් රු.626,269 ක් වශයෙන් එකතුව රු.4,095,600 ක් පියවා නොතිබුණු අතර ඒ තුළ වසර 05 ඉක්ම වූ අත්තිකාරම් රු.791,900 ක් ද, වසර 02 ඉක්ම වූ අත්තිකාරම් රු.202,225 ක් හා මාස 01 ත් මාස 10 ත් දක්වා කාලයකට අදාළ අත්තිකාරම් රු.1,814,544 ක් ද විය. | මෙම සියළු අත්තිකාරම් මුදල් නිසි පරිදි පියවන ලෙස දැනුම් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කාර්යය නිමකළ විගස අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 104 (1) , (3) හා (4) | පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ සිදු වූ වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදුකර නොතිබුණු අතර මූලික පරීක්ෂණ සිදුකළ වාහන අනතුරු 12 ක අලාභ අයකර ගැනීමට හා චූදිතයින්ට විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම අනතුරු සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට අදාළව විනයානුකූලව පියවර ගැනීමටත්, අලාභය අය කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම පරීක්ෂණ කටයුතු සිදුකර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 1641 සිට 1647 දක්වා | අධිකාරියේ වාහන හදිසි අනතුරු සම්බන්ධයෙන් නිසි ආකාර පරීක්ෂණ පවත්වා නොතිබීම, පෙට්‍රෝල් හා බඩු බාහිරාදිය ලේඛනගත කර නොතිබීම, වාහන අලුත්වැඩියා කිරීම්වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබීම, එකම අලුත්වැඩියාව නැවත නැවත සිදු කර තිබීම හා තාක්ෂණ නිලධාරීගේ සනාථ කිරීම් නොතිබීම, වාහන ලොග් සටහන් පොත්, දෛනික ධාවන සටහන් හා ගමන් පිළිබඳ මාසික සාරාංශ යාවත්කාලීන කර නොතිබීම, වාහනවලින් ඉවත් කරනු ලබන කොටස් ගබඩාවට භාරදී නොතිබීම, දීර්ඝ කාලයක් තිස්සේ වාහන එකතැන ගාල් කර තිබීම යනාදී කරුණු අනුව වාහනවල ආරක්ෂාව, නඩත්තුව හා ඒවායේ අරපිරිමැස්ම කෙරෙහි නිසි අවධානයෙන් යුතුව කටයුතු කර ඇති බවට නිරීක්ෂණය නොවීය. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක විසින් අමාත්‍යාංශයේදී ලබාදුන් උපදෙස් පරිදි වාර්තාවේ නිර්දේශ විධිමත් ලෙස ක්‍රියාත්මක කර ඉහත ගැටලු අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | වාහන සම්බන්ධව මනා අභ්‍යන්තර පාලනයක් ඇති කරගත යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී නියමිත පරිදි ප්‍රධාන කාර්යාල ගිණුමට මාරු නොකර රු.333,488,686 ක මුදලක් මාස ගණනාවක් දිස්ත්‍රික් කාර්යාල බැංකු ජංගම ගිණුම් තුළ රඳවා ගැනීමත්, ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමෙහි වියදම් අවශ්‍යතාවය ඉක්මවා රු.129,209,300 ක සාමාන්‍ය මාසික තැන්පතු ශේෂයක් තබා ගැනීමත් හේතුවෙන් එම මුදල් ආයෝජනය කිරීම තුළින් උපයා ගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. | බදුල්ල හා හම්බන්තොට කාර්යාලවලට අදාළ ලංකා බැංකු රැස් කිරීමේ ගිණුම්වල 2022 දෙසැම්බර් 31 දිනට වූ මුදල්, 2023 මාර්තු 27 දින ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමට බැර වී ඇති අතර 2023 මැයි 02 දින රු. මිලියන 300 ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර ඇත. | නිසි මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගනිමින් රැස් කිරීමේ ගිණුම්වල පවතින මුදල් අප්‍රමාදීව ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීමටත්, මාසික අවශ්‍යතාවය ඉක්මවා ජංගම ගිණුම්වල මුදල් රඳවා නොගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එකතු කළ අගය මත බදු අය කළ හැකි සැපයුම රු.416,488,904 ක් වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ එකතු කළ අගය මත බදු වාර්තා අනුව එම අගය රු.394,686,528 ක් වූයෙන් බදු අය කළ හැකි සැපයුම රු. 21,802,376 ක් ද, ඊට අදාළව සියයට 15 ක් වන එකතු කළ අගය මත බද්ද රු.3,270,356 ක් ද අඩුවෙන් ගිණුම් ගතකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණි. | අදහස් දැක්වීම නිවැරදි නොවේ. | බදු අයකළ හැකි සැපයුම නිවැරදිව බදු වාර්තාවට ඇතුළත් කර ගණනය කරනු ලබන නිවැරදි එකතු කළ අගය මත බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 48,482,055 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 22,121,759 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,360,296 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ පුනරාවර්තන ප්‍රදාන සියයට 7 කින් ඉහළ ගොස් වැඩසටහන් වියදම් සියයට 78 කින් පහළ ගොස් තිබුණ ද, අධිකාරියේ මෙහෙයුම් ආදායම සියයට 19 කින් පහළ ගොස් මෙහෙයුම් වියදම් සියයට 10 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මෙහෙයුම් ආදායම තුළ ඇතුළත් දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 315 කින් ඉහළ ගොස් අන්තරාදායක අපද්‍රව්‍ය ආදායම සියයට 45 කින් ඉහළ යාම හේතුවෙන් අධිකාරි ආදායම සියයට 19 කින් පහළ ගොස් ඇත.
මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් ඉන්ධන හා ප්‍රවාහන වියදම් සියයට 77 කින් ඉහළ ගොස් ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වියදම් සියයට 79 කින් ද, නඩත්තු හා අලුත්වැඩියා වියදම සියයට 47 කින් ද පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් ඇත.

### 2.3 අනුපාත විශ්ලේෂණය

මෙහෙයුම් මත ශුද්ධ අලාභය පෙර වර්ෂයේ සියයට 1.62 ක් වූ අතර 2022 වර්ෂයේදී එය සියයට 3.6 ක් දක්වා ඉහළ ගොස් තිබූ අතර එයට ප්‍රධාන වශයෙන් අරමුදල් සීමා කිරීම හේතුවෙන් භාණ්ඩාගාර අරමුදල් ලැබීම් සියයට 70 කින් පහළයාම හේතු වී තිබේ.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| නිසි අධීක්ෂණයක් යටතේ ඉන්ධන ලැබීම්, නිකුත් කිරීම් හා ලේඛනගත කිරීම් සිදු කර නොතිබීමෙන් 2022 ජුනි 08 දින සිට 2022 අගෝස්තු 16 දින දක්වා කාලය තුළ අධිකාරියේ විදුලි ජනන යන්ත්‍රය සඳහා මිලදී ගෙන ගබඩා කර තිබුණු රු.713,800 ක් වටිනා ඩීසල් ලීටර් 1660 ක් අස්ථානගත වී තිබුණු අතර ඊට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභයන් අයකරගෙන නොතිබුණි. | මුළු අලාභය හා සියයට 25 ක අධිභාරය වන රු.892,250 ක් ආරක්ෂක කටයුතු සිදු කළ ආයතනයෙන් අයකරගෙන ඇත.<br>මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කර අභ්‍යන්තර විමර්ෂණයක් ද සිදු කරමින් පවතින අතර විමර්ෂණයට අනුව ඉදිරියේ දී ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලැබේ. | අදාළ පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකරගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය සඳහා අවුරුදු 50 ක බදු පදනම මත 2000 වර්ෂයේ අතිරේකව ලබා ගත් පර්චස් 129.88 ක ඉඩම් කොටස වර්ෂ 19 කට වැඩි කාලයකත්, පර්චස් 109.88 ක බිම් කොටස වසරකට වැඩි කාලයක් සිට භුක්ති විඳිමින් පැවතිය ද අදාළ බදු මුදල් ගෙවා නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් එයින් පර්චස් 20 ක ඉඩම් කොටසක් වෙනත් ආයතනයකට ලබා දී තිබුණි. | මේ වන විට පර්. 109.88 ක බිම් කොටස සඳහා මුදල් ගෙවා නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 1988 වර්ෂයෙන් පසු සංශෝධනය කර නොතිබුණි. | යෝජිත ජාතික පාරිසරික (සංශෝධන) පනතෙහි අවසන් කෙටුම්පතෙහි අයිතම 30 ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව නීතිපතිතුමා විසින් දැනුම් දීමෙන් පසුව එකී අයිතම 30 සඳහා අධිකාරියේ නිරීක්ෂණ පරිසර අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත | පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 2023 අප්‍රේල් 18 දින යවා ඇත. | |
| (ඇ) | මහා භාණ්ඩාගාරයෙන් සහ විදේශාධාරවලින් ලැබී ඇති ව්‍යාපෘති ප්‍රදානවලින් ඉතිරි වී ඇති රු.18,527,257 ක් වර්ෂ 04 ක සිට වර්ෂ 09ක් දක්වා කාලයක් නිරවුල් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වගකීමක් වශයෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂවල ගිණුම් පරීක්ෂා කර බලා මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ ගැලපීම් 2023 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරමි. | ඉතිරි මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණ කටයුතු සඳහා වසර 05 ක කාලයකට 2013 වර්ෂයේදී අධිකාරිය වෙත ලබා දී ඇති අංක LK–8428 දරන ජංගම වායු තත්ත්ව රසායනාගාරයේ ගිවිසුම් කාලය 2018 ජූලි මස අවසන් වී තිබුණි. එසේ වුවද, එම ගිවිසුම නැවත දීර්ඝ කර ගැනීමට හෝ වත්කම මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට අක්‍රිය තත්ත්වයේ පවතින මෙම ජංගම වායු තත්ත්ව රසායනාගාරය අළුත්වැඩියා කිරීම සඳහා මුදල් ලබා දීමට හෝ ගිවිසුම් අලුත් කිරීමට එකඟතාවයක් නොමැති අතර එය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුව වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. | අවශ්‍යතාවය හා අලුත්වැඩියා කිරීමේ හැකියාව සලකා බලා ඊට අනුව කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුරකිමු ගංඟා වැඩසටහනේ අරමුණුවලට අනුකූල නොවන ආකාරයට එම ප්‍රතිපාදනවලින් රු.2,030,000 ක් වැය කර විදුලි කරත්තයක් (Electric cart) මිලදී ගෙන කතරගම පූජා භූමියේ පරිහරණය සඳහා යොදවා තිබුණි. | මෙම කටයුත්ත සුරකිමු ගංගා වැඩසටහනෙහි අරමුණු සමග බැඳී ඇති බවට නිවැරදි නොවන අදහස් දැක්වීමක් සිදුකර ඇත. | වැඩසටහන් අරමුණුවලට අනුකූල ලෙස අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසිවලට පටහැනිව මාතර අකුරැස්ස ප්‍රාදේශීය සභාවට අයත් කාබනික පොහොර නිෂ්පාදන අංගනයේ එකතු වන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පරිසර හානියක් සිදු නොවන ආකාරයට සනීපාරක්ෂක ලෙස බැහැර කිරීමට කටයුතු නොකර අනාරක්ෂිත පරිදි විවෘත භූමියකට බැහැර කර තිබුණු අතර භූගත ජලයට හෝ බාහිර පරිසරයට එක් නොවන ආකාරයට කළමනාකරණය කළ යුතු කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියේදී | අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය සම්බන්ධයෙන් පසු විපරම් කර නිශ්චිත කාල රාමුවක් තුළ නිවැරදි කරන ලෙසත්, එසේ නිවැරදි නොකළහොත් නීති මාර්ගයෙන් ක්‍රියා කරන බවත් අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත දන්වා යැවීමට නියමිතය. | අදාළ කසල අංගනය නියමිත ප්‍රමිතවලට අනුව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජනනය වන ක්ෂීරිතය (Leachate) මඟින් වළවල් පිරීගොස් බාහිර පරිසරයට එකතුවීමේ අවධානමක් පවතින බවට ද නිරීක්ෂණය විය. තවද, මෙම පරිශ්‍රය තුළ යාවත්කාලීන කරන ලද ගිණි නිවීමේ උපකරණ සහ පහසුකම් ද පවත්වාගෙන ගොස් නොතිබුණි. | | |
| (ඇ) | පරිසර කළමනාකරණ කටයුතු සිදු කිරීමේදී තොරතුරු රැස් කිරීම අරමුණු කොටගෙන 2020 දෙසැම්බර් 15 දින රු. මිලියන 1.39 කට මිලදී ගෙන තිබූ ඩ්‍රෝන යන්ත්‍රය ගුවන්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ ගිවිසුම අත්සන් කිරීමට 2022 ජූලි 15 දක්වා කල්ගත කර තිබුණු අතර ඉන් අනතුරුව ද කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට නිරීක්ෂණය නොවීය. | අදාළ කාර්යය, ප්‍රමුඛතාවය සලකා කටයුතු සිදු කරමින් පවතී. | අදාළ වත්කම් උපරිම කාර්යක්ෂමතාව යෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ජාතික පරිසර තොරතුරු කේන්ද්‍රයේ කටයුතු සඳහා පුස්තකාල කමිටුවක් පිහිටුවා නොතිබුණු අතර වාර්ෂිකව හා එහි භාරකාරිත්වය වෙනස් වන අවස්ථාවලදී තොග සමීක්ෂණයන් ද සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් 2022 දෙසැම්බර් 23 දින ඉදිරිපත් කර තිබුණු 2021 වර්ෂය අවසාන සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගත් නැතිවූ පොත් 2746 ක අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. තවද, ක්‍රමවේදයක් සහ අනුමැතියක් නොමැතිව පරිග්‍රහණ ලේඛනයෙන් පොත් 1,983 ක් ඉවත් කර තිබුණි. | පුස්තකාල උපදේශන කමිටුවක් 2023 වසර සඳහා පත්කර ඇත. නැතිවී ඇති පොත්පත් 1984 වසරේ සිට මේ දක්වා කාලයට අදාළ වන බැවින් ඒ සඳහා ස්වාධීන කමිටුවක් පත්කර තොග සමීක්ෂණයක් නැවත සිදුකර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු සූදානම් කර ඇත.<br>අදාළ උපදේශන මත පරිග්‍රහණ ලේඛනය ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු සිදු කරනු ඇත. | අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභ අයකර ගැනීමටත්, පරිග්‍රහන ලේඛනයෙන් පොත් ඉවත් කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සුරකිමු ගංගා වැඩසටහනට අදාළව සමාලෝචිත වර්ෂයේදී රු.1,083,333 කට මිලදී ගත් තණකොළ කපන යන්ත්‍ර (Brush Cutter) 60 න් රු.98,484 ක් වටිනා යන්ත්‍ර 05 ක් අස්ථානගත වී තිබුණු අතර ඊට අදාළව සිදුකරන පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | බෙදාහැරීමේදී යන්ත්‍ර 05 ක් අස්ථානගත වීම සම්බන්ධව අනාවරණය වූ අතර ඒ පිළිබඳව තලංගම පොලිසියට පැමිණිලි කර අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් විමර්ශණයක් සිදු කරමින් පවති. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමටත්, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂයන්හිදී පිළිවෙළින් රු.3,577,108 ක් හා රු.8,028,200 ක් ගෙවා මිලදී ගෙන තිබූ Dusk Track DRX Desktops Model 8553 උපකරණය සහ Micro mate Instant වර්ගයේ කම්පන විශ්ලේෂණ උපකරණ 02 ක් නියමිත කාලය තුළ ක්‍රමාංකනය සිදු නොකිරීම නිසා 2022 වර්ෂයේ අවසානය දක්වාම නිෂ්කාර්යව පවතුණි. | මෙම උපකරණ දෙක ක්‍රමාංකනය කිරීම සඳහා 2023 මැයි 11 දින නියෝජිත ආයතනය වෙත භාර දී ඇති අතර අදාළ ක්‍රමාංකනයන් සිදු කර එම භාණ්ඩ 2023 මැයි 31 දින නැවත අධිකාරිය වෙත භාර දීමට නියමිතය. | උපකරණ නියමිත පරිදි ක්‍රමාංකනය කර කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියට අයත් රත්නපුර පළාත් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2018 වසරේදී රු.1,675,350 ක් ගෙවා තිබුණ ද, එම ඉදිකිරීම සිදුකර නොතිබුණි. ගෙවූ මුදල කෙරීගෙන යන වැඩ යටතේ පෙන්විය යුතු වුවත්, ලැබිය යුතු මුදලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රාග්ධන ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා තැබීමට සිදු විය. ඉදිකිරීම් අවසන් වූ විට ප්‍රාග්ධනිත වත්කමක් ලෙස හඳුනාගැනීම සිදුවේ. | අවශ්‍යතාවය අනුව ඉදිකිරීම් කටයුතු සිදුකිරීමටත් නියමිත වර්ගීකරණය යටතේ ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාපනය කර වසරක් වැනි කෙටි කාලයක් ගත වූ පුද්ගලික සමාගමක් සමඟ 2014 අගෝස්තු 08 දින ඇති කර ගත් ගිවිසුමක් මත එම සමාගමේ පූර්ව ක්‍රියාකාරකම් හා කාර්යසාධනය පිළිබඳ අදහසකින් තොරව කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියකට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා නොගෙන ගිවිසුමකට එළැඹ තිබුණු නමුත් මේ දක්වා ව්‍යාපෘතිය | මාතර කොටවිල කසළ මඟින් විදුලිය නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදි කිරීම් පමා වීම සම්බන්ධයෙන් නිති මාර්ගයෙන් ක්‍රියා කිරීමට නිති උපදෙස් ලබා ගැනීම සඳහා 2023 මැයි 10 වන දින නීතිපති වෙත යොමු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නිසි අධිකාරී බලය සහිත අනුමැතිය මත ගෙවීම් සිදු කළ යුතු අතර පූර්ව අනුමැතිය ලබා නොගෙන කටයුතු කළ නිලධාරින් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ආරම්භ කර නොතිබුණු අතර එම සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ද ගැටලුකාරී තත්ත්වයක් පැවතුණි. ඒ හේතුවෙන් වැය කළ රු.64,356,400 ක මුදල ද, 2009 වර්ෂයේදී පිළිසරු ව්‍යාපෘතිය මඟින් කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා වැය කළ රු.13,071,372 ක මුදල ද, කසළ භාවිතා කරමින් විදුලිය නිපදවීම සඳහා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ද නිෂ්කාර්ය වී තිබිණි. | | |

**3.8 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර එම අමාත්‍යාංශය විසින් 2001, 2003 හා 2012 යන වර්ෂවලදී අධිකාරියේ පරිහරණය සඳහා ලබා දී තිබුණු රු.27,630,000 ක් වටිනා කැබ් රථ 16 ක නීත්‍යානුකූල අයිතිය පවරා නොගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | පරිහරණයට ලබාදී තිබූ කැබ් රථ 16 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත පවරා ගැනීම්වලට අදාළ ලියකියවිලි භාරදීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්ගත කර පරිහරණය කරනු ලබන වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |